**අධ්‍යාපන අමාත්‍යාංශය - උපකාරක ප්‍රශ්න පත්‍රය**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය - 2023/2024**

**11 ශ්‍රේණිය** **බුද්ධ ධර්මය**

## 11 කොටස

- **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

**1. කෙටි පිළිතුරු සපයන්න.**

(i) සිදුහත් කුමරුට නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ii) ''සුපටිපන්න'' සඟ ගුණයෙහි අර්ථය ලියන්න.

(iii) බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් ගිජුලෙස ආහාර අනුභව කරන්නන් **දෙදෙනෙක්** නම් කරන්න.

(iv) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් භෝග විනාශ වන ක්‍රම **දෙකක්** ලියා දක්වන්න.

(v) ''අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති

අත්තනා අකතං පාපං - අත්තනාව විසුජ්ඣති.......'' යන ගාථාවෙහි අදහස ලියා දක්වන්න.

(vi) සරණංකර හිමියන් රචනා කරන ලද කෘති **දෙකක්** නම් කරන්න.

(vii) ''අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ '' මෙම පාඨයේ අදහස ලියන්න.

(viii) ත්‍රිලක්ෂණය නම් කරන්න.

(ix) ''නාමරූප පච්චයා සළායතන'' යන්නෙහි අර්ථය ලියන්න.

(x) කාව්‍යශේකරය හා ලෝවැඩ සඟරාව යන කෘති රචනා කළ කතුවරුන් ලියා දක්වන්න.

2. (i) ''තඤ්ච කම්මං කතං සාධු'' යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න.

(ii) ඉහත (i)හි සඳහන් ගාථාවේ අර්ථය ලියා දක්වන්න.

(iii) පුද්ගල ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්ම පදයෙන් ලැබෙන ආදර්ශ ඇගයීමට ලක් කරන්න.

3. (i) ප්‍රථම ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු **දෙකක්** ලියා දක්වන්න.

(ii) පළමු ධර්ම සංගායනාව පැවැත්වීමට මූලිකත්වය ගත් රහතන් වහන්සේ, අනුග්‍රහය දැක්වූ රජතුමා, හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියා දක්වන්න.

(iii) ධර්මය හා විනය සුරක්ෂිත කිරීමට පළමු ධර්ම සංගායනාවේ දී ගත් ක්‍රියා මාර්ග ශාසන චිරස්ථිතියට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

4. (i) දස පාරමිතාවලින් දෙකක් නම් කරන්න.

(ii) ඉහත (i)හි නම් කළ පාරමිතාවක් පැහැදිලි කරන්න.

(iii) බෝසත් සමාජයක් නිර්මාණය කිරීම සඳහා දස පාරමිතා උපයෝගී කරගත හැකි ආකාරය ඇගයීමට ලක් කරන්න.

5. (i) චතුරාර්ය සත්‍ය අතුරෙන් දෙකක් නම් කරන්න.

(ii) අටුවාවේ තුන් ආකාරය වූ දුක එය නම් කර කෙටියෙන් හඳුන්වන්න.

(iii) ශිෂ්‍ය ජීවිතයේ ගැටළු විසඳා ගැනීමට චතුරාර්යය අදාළ කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

6. (i) සිල් රැකීමේ ආනිසංස දෙකක් ලියන්න.

(ii) ඉහත (**i**) හි සඳහන් එක් කරුණක් හඳුන්වන්න.

(iii) සිල් රැකීම තුළින් පුද්ගල හා සමාජ සංවර්ධනය ඇති කර ගතහැකි ආකාරය පැහැදිලි කරන්න.

(7) පහත මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා

(ii) පන්සිය පනස් ජාතක පොත

(iii) මහනුවර යුගයේ චිත්‍ර කලාව

(iv) කණිෂ්ක ධර්ම සංගායනාව

**iruonline.com**